අභ්‍යන්තර ලිපිය
உள்ளக கடிதம்
Internal Letter

ශ්‍රී ලංකා රේගුව
இலங்கைச் சுங்கம்
Sri Lanka Customs

මානව සම්පත් කළමණාකරණ අංශය
மனிதவள முகாமைத்துவப் பணிப்பகம்
Human Resources Management Directorate

Tel : (Ext : 7600,7601,7606,7607,7611)

මගේ අංකය:
எனது இல :
My No. : AB/2B/03/DSC-Pro.

ඔබේ අංකය:
உமது இல :
Your No :

දිනය :
திகதி :
Date : 2020.03. 04

SRI LANKA CUSTOMS
435
04 MAR 2020
ICT Directorate

රේගු අධ්‍යක්ෂ,

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය,

**නියෝජ්‍ය රේගු අධිකාරි තනතුරට උසස් කිරීමේ නිවේදනය**

**දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය රේගු අධිකාරි තනතුරු පුරප්පාඩු සඳහා සහකාර රේගු අධිකාරි නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය මත පත්කිරීමට අදාල අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ (භාෂා ත්‍රිත්වයෙන්) හා අයදුම්පත්‍රයේ පිටපත් මේ සමඟ ඔබ වෙත එවමි.

02. මෙය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

**යුෂාන් තරංග අබේකෝන්**

නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

SC
7 n a/ol.
04/03/2020 DC

දැන්වීමයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම

නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි 2019.12.31 දින දක්වා ඇති වූ පුරප්පාඩු 194 ක් පිරවීම සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට තම තනතුරෙහි ස්ථිර කර ඇති සහකාර රේගු අධිකාරීවරුන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ජ්‍යෙෂ්ඨතාවය මත පමණක් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

02:1 වෘත්තීය සුදුසුකම්:

(i) සහකාර රේගු අධිකාරී I ශ්‍රේණියේ ස්ථිර පත්වීමක් ලබා තිබීම.

(ii) අයදුම්පත් කැඳවන දිනට සහකාර රේගු අධිකාරී I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර 05 තුළ නියමිත දිනට වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම

(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වූ වසර පහ (05)ක කාලය තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**සටහන :**

''කෙසේවතුදු නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩුවක් පවතිද්දී ඉහත 02:1 (ii) හි දැක්වෙන පූර්ව අවශ්‍යතාවයන් සපුරා ඇති ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැතිවිටක එම තනතුරු පිරවීමේ වෙනත් විකල්පයක් නොමැතිකම සලකා සහකාර රේගු අධිකාරී I හා II ශ්‍රේණිවල සතුටුදායක සේවා කාලය ගණන් බලා ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් අනෙකුත් පූර්ව අවශ්‍යතා සපුරා තිබීමට යටත්ව, නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරට පත්කිරීමට සුදුසුකම් ලබයි.''

02:2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය.

II. පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්ය.

III. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මඟින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත්වේ.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

04. වැටුප් පරිමාණය - රු.41,580-11x755-18x1,030-68,425/- මාසික වැටුප් පරිමාණයේ (2016.02.25 දිනැති රා.ප.ච. අංක 3/2016 හි අංක MN 7 –2016 වැටුප් ඛණ්ඩය) 06 වන වැටුප් පියවර මෙම තනතුරට හිමි ආරම්භක වැටුප් පියවර වේ.

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කරඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදි සියළුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

I. පුද්ගයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

06.

(අ) අයදුම්පත් **2020.03.16** දිනට හෝ එදිනට ප්‍රථම රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර තමාගේ අත් අකුරෙන් සම්පූර්ණ කල යුතු වේ.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ "නියෝජ්‍ය රේගු අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කල යුතුය.

(ඈ) නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන අංශයේ, අංශ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කල යුතුය.

(ඊ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

07. සාවද්‍ය තොරතුරු සැපයීම.

- ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාලව විනයානුකූලව ක්‍රියා කරනු ලැබේ.

- පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

- මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ලේකම්,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01.
2020/03/02

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ
මහලේකම් කාර්යාලය
කොළඹ 01

**Notice**

**Public Service Commission**

**Filling up Vacancies in the post of Deputy Superintendent of Customs**

Applications are invited from Assistant Superintendents of Customs who have been confirmed in the post on or before the closing date of calling applications, to fill 194 vacancies existing in the post of Deputy Superintendent of Customs as at 31.12.2019

**01. Method of Recruitment**

Recruitment will be made out of the candidates who have fulfilled the qualifications requirements prescribed in the notice, upon the results of an interview conducted by a board of interview appointed by the Public Service Commission, only on the basis of seniority, in accordance with the number of vacancies.

**02. Required Qualifications**

2.1 Professional Qualifications

i. Should have received a permanent appointment in the post of Assistant Superintendent of Customs Grade I

ii. Should have completed an active and satisfactory period of service in the immediately preceding 05 years as at the closing date of applications and not been subject to any form of disciplinary punishment.

iii. Should have earned all the increments during the immediately preceding five (05) years as at the date of promotion

iv. Should have demonstrated an average or higher performance level in accordance with the approved scheme of performance evaluation, during the immediately preceding five (05) years as at the closing date of applications.

**Note**

" However, when there is a vacancy in the post of Deputy Superintendents of Customs, taking into consideration the non-availability of adequate number of officers who have fulfilled prior requirements specified in para ii above, the most senior officers who have completed satisfactory period of service in the post of Assistant Superintendent of Customs Grade I and II, gain eligibility to be appointed to the post of Deputy Superintendent of Customs, subject to the fulfilment of the other pre-requisites".

**2.2 Physical Qualifications**

Every candidate should be physically and mentally fit to serve in any part of the island and to perform the duties of the post.